

# ඊයම්බරු - බෙරලියන්තු සහ බහු වචන




බහු වචන යන්න අපට ඉස්කෝලේ දී කියා දීපු එක නොවෙයි. අපේ ආතාලා මුත්තලා අපට තරවටු කිරීමට කියාපු වචන දෙකක්. මුනෑ නැති පණ්ඩිත කතා කියන්නට ගිය විටක අපට නිසැකවම ලැබෙන පිළිතුර - අවවාදය වෙන්නේ

"කොල්ලෝ මගෙත් එක්ක ඔය බහුවචන කතා නොකර තේරෙන බාසාවකින් කියන දෙයක් කියහන්"

මා මේ ලියන්නේ අන්න ඒ කියාපු වර්ගයේ බහුවදන ගැනයි.

මා වරක් ඇසූ දෙයක් - ඇසූ ප්‍රශ්නයක් නැවත ලියමි.

"අමරදේවයෝ යන්නෙහි ඒක වචනය කුමක්ද?" "අනේ ඒ උත්තමයාට එහෙම අගෞරව කරන්නේ කොහොමද?" කියලා තක්කු මුක්කු වෙන එක නම් සිකුරුය.

එහෙම තක්කු මුක්කු වෙන - මනස්ගාත ලියන - උගතුන්ගේ අවධානය සඳහා මම වරක් මව්බිම පත්තරයට ලියූ ලිපියක් මගේ "පිරිමි ජාතිය උතුම් ජාතිය" නම් වූ ලිපි එකතුවට ඇතුළත් කළෙමි. එහි මාතෘකාව "ලබ ධාතුවේ බල මහිමය" යන්නය. ජනාධිපති මහින්ද රාජපක්ෂ පවා ඒ බලයට යටත්ව සිටින බව එහිලා දැක්වූයෙමි. ශ්‍රී ලාංකික හස්තිරාජයාට මගේ වීණාව ඇහුණ පාටක් නැත .

ඒක වචන බහු වචන භේදය - උක්තානුක්ත භේදය - සම්බන්ධය යන කරුණු අපට කියා දුන්නේ පරණ පාසලේ සිංහල ගුරුවරයාය. හැම විෂයන්ම අපට කියා දුන් ගුරුවරයාය. සරසවියේදී මහාචාර්ය ඩී ජේ හෙට්ටිආරච්චි ඉංගිරිසියෙන් සිදත් සඟරාවේ එන කරුණු කියා දුන්නත් ඉන් ඔබ්බට අප උගත් වියරණයක් නැත .

සරසවිය භාෂාව හා වියරණය උගන්නව තැනත් නොවන බව මට හොඳ හැටඅ අවබෝධ වූයේ තමාගේ ගොලයකු බව මහාචාර්ය ජේ බී දිසානායක මටම කියූ මහැදුරකුට පවා නිවැරදි වැකියක් ලියාගන්නට බැරි බව දුටුදා ය. මෙරට සිංහල ලියන හා උගන්වන දෙතුන් දෙනෙකුගේ දිරි ගැන්වීම අනුව මා විසින් "සරල සිංහල වියරණ විදි" නම් පොත් පිංචක් ලියන ලද්දේ ජේ බී මා හමුවීමට ආවාට පසුවය. පාසල් පොතක් වශයෙන් අනුමත කරනු ලැබුවත් ඒ අනුමැතිය ගැන හොඳට දන්නා මට එහි ආනිශංසය ගැනද විශ්වාදයක් නැත .

මේ ලිපිය ලිවීමට අවසාන ප්‍රේරකය වූයේ මා කියවූ නවකතාවකි. නමින් පමණක් මා දන්නා - අද සිටින දක්ෂ නවකතාකරුවකු හා සරසවි ඇදුරකුද වන ලියනගේ අමරකීර්ති ලේ "කුරුලු හදවත" කියවූ විටය.

අලංකාරවත් බව
පසුතලමය
අලෝකමය
පාරිකල්පනික බැඳීමක්
නොස්සුවදායක

සරසවි සිසුනට සිංහල උගන්වන ඇදුරකු මෙහෙම වචන වලට යට වන්නේ ඇයිද කියන ගැටලුවය මට ඇති වූයේ. ළඟදී මිය ගිය කසුරි ගේ "මම තවම යමි" නම් නවකතාව කියවන විටද මට ඒවාගේම වචන කිහිපයක් හමුවිය.

නෝබට් අයගමගේ ලියූ "කාල නදී ගලාබසී" නවකතාවේද එබඳු යෙදුම් දැකිය හැකිය.

ඒ වන විට දවල් මධ්‍යහ්නය විය.
සාවධානව එහෙත් අවධානයෙන්

මගේ සරළ සිංහල වියරණ විදි පොතෙහි ලා මම ශ්‍රී ලංකාවේ ප්‍රධාන පත්තර වෙතින් නිදසුන් ඉදිරිපත් කොට සරල වියරණ වැරදි පෙන්වා දුනිමි.

මා යෙදූ මුල් වචන දෙක යට දැක්වූ නිදසුන් වලින්ම සනාථ වන්නේය. ඊයම්බරුව දියට දැමූ විටම යට යන්නකි. බෙරලියන්තුව දුටු මතින්ම අපි එය බාල ආභරණයක් බව ද දනිමු. ඒ දෙකම අගය කළ හැකි දේ නොවෙයි. ඇයි එසේ නම් භාවිත කරන්නේ? මට කළ හැක්කේ ප්‍රශ්නය ඇසීම පමණකි. පිළිතුරු මා ළඟ නැත. ඒ නිසා මම ප්‍රශ්නය තවත් ඇඟට වදින විදියට ඉදිරිපත් කිරීමට බලමි.

පත්තරකාරයා නොහොත් පුවත්පත් කලාවේදියාට කාලය ඉතා අගනේය. හිත හිතා වචන තෝර තෝරා ලිවීමට ඔහුට කාලයක් නැත . ලියන දේ ලස්සනට ලිවීමට අවශ්‍යය. වටහා ගලැනීමට පහසු විය යුතුය. නවතාවක් ඇතොත් තවත් හොඳය. නියමිත වේලාවට ලිපිය බාර දීමට වග බලාගත යුතුය. ඒ සියලුම කාරණා ඉටු කිරීමේ වගකීම පුවත්පත්කලාවේදියා පිට පැටවෙන්නේය. ඔහු ලියන දේ විශ්වාස කරවනා කිසිවක් අනුමත කළ යුතුද නැත . මා ලියන්නේද ඒ බව සිතෙක් තබාගෙන ය. ඒ සමගම මට අවධාරණය කිරීමට ඇති එකම කරුණ නම් මගේ යට කී පොතෙන්ද පෙන්වා දුන් පරිදි සාමාන්‍ය භාවිතයට අවශ්‍ය වියරණ විදි ඉගෙන ගැනීම මහ වැඩක් නොවන බවය. සැළකිය යුතු දැනුමක් ඇති කවරකුට වුවත් දවසක දෙකක අධයයනයකින් සපුරා ගත හැකි මූලික සුදුසු කමකි ඒ.

අප ඉස්සර කියවූ - උගත් - තියොඩෝර් බී පෙරේරා උන්නාන්සේගේ සිංහල භාෂාව කියවිය යුතු නොවේ. එය 1932 දී ලියන ලද පරණ පොතකි. අප උගත් විභක්ති සමාස සන්ධි උපසර්ග නිපාත වැනි උපාංග අධ්‍යයනයද අවශ්‍ය නොවේ. උපසර්ග කට පාඩම් කර ගත යුතු නොවේ. අවබෝධ කර ගත යුතු යයි මා කල්පනා කරන කිහිපයක් මෙසේ දන්වමි.

උක්ත අනුක්ත භේදය
උක්ත ආඛ්‍යාත භේදය
කර්තෘකාරක කර්මකාරක වාක්‍ය
(ලබ ධාතුව බලපාන්නට පටන් ගන්නේ මෙය මෙය බැරිවුණ තැනය)
කියවන්නා බිය වද්දන අමාරුවේ දමන අර කියාපු බහුවචන රහිත බස් වහරක් පුරුදු කර ගැනීම

යන කරුණු පමණක් හොඳ ලේඛකයකු වීමට සෑහෙන බව මම සිතමි.

අපට නිතර හමුවන යෙදුම් කීපයක් දක්වමි. දෙ-දෙනකු හමුවීම මුණගැසීම කීමට ඒ වචන පමණක් සෑහෙයි. එහෙත් එය සම්මුඛ වීම යනුවෙන් ලිවීම මීනා ලියූ යුගයට ආපසු යාමක් බව ලියන්නා නො දනියි. අපි දැන් පිවිස සිටින්නේ පෑන පැන්සල අත් හළ යුතු යුගයකට බව ඔවුන්ට තවම නොවැට-හේද? හෙට අනිද්දා නොව අද පවා කඩදාසි පොතපත කියවීම අප වැනි මහල්ලන්ට කෙසේ වුවද තරුණයන්ට නුපුරුදු ව්‍යායාමයක් වනු සිකුරුය.

කතා කරනා හා ලියන බස අතර පරතරය සහ මතභේදය අපට පමණක් සීමා වූවක් නොවේ. 1977 දී මා නෝර්වේ රටේ දුටු මූලික වාදයක් වූයේ ඔය දෙකම ලිවීමට යොදා ගැනීමේ අවශ්‍යතාව සහ සුදුසුකම පිලිබඳවය. වාදය අවසන් වූයේ කසේදැයි මම නොදනිමි.

අපට පසු ඉදිරියට යන පරපුර ඔය කරදර වලින් මිදෙනු සිකුරුය. ඉදිරි දවස් කීපය තුළ වුවත් අපි ඊයම්බරු මෙන් කියවන්නා දියේ හිටවීමට් බෙරලියන්තු පැළඳ කියවන්නා මවිත කිරීමට හෝ බහුවචන ලියා කියවන්නා අන්ද මන්ද කිරීමට හෝ පුරුදු නොවී සිටිමු.




# හොරණ

## ඉඩමක් හා නිවස විකිණීමට

**හොරණ නගරයට ආසන්න**
**සියළු පහසුකම් සහිත**
**පර්චස් 20ක ඉඩමක් හා නිවස**
**විකිණීමට තිබේ.**
**විස්තර සඳහා අමතන්න 0411 421 227**